# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1471 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 25/11/2023<br>පැය 1405 |

## මාධ්‍ය නිවේදනය

**සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමට යාමේදී දියේ ගිලී මිය ගිය ආධුනික පොලිස් කොස්තාපල් ක්‍රිෂ්ණමූර්ති ප්‍රතාපන් නිලධාරියා පොලිස් සැරයන් නිළයට උසස් කිරීම.**

කැළණිය පොලිස් කොට්ඨාසයට අනුයුක්තව ජා ඇළ පොලිස් ස්ථානයේ රාජකාරි යෙදී සිටි ආධුනික පොලිස් කොස්තාපල් 99033 ක්‍රිෂ්ණමූර්ති ප්‍රතාපන් නිලධාරියා, 2023.11.23 වන දින පොලිස් අත්අඩංගුවේ සිටි සැකකරුවෙකු ජා ඇළ පොලිස් ස්ථානය අසල ඇති ජා ඇළ ඇළට පැන පලා යාමට උත්සාහ කල අවස්ථාවේ නැවත අත්අඩංගුවට ගැනීමට යාමේදී නීත්‍යානුකූලව ස්වකීය රාජකාරි ඉටු කිරීමට ගොස් දියේ ගිලී මිය ගොස් ඇත.

මෙම මිය ගිය නිලධාරියා පශ්චාත් උසස්වීම් පදනම යටතේ පොලිස්පතිතුමා විසින් 2023.11.23 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලිස් කොස්තාපල් තනතුරේ ස්ථිර කර, පොලිස් සැරයන් තනතුරට උසස් කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**